## කිඹුලා

**(කුලය - ක්‍රොකඩයිලිඩේ)**

සබ්මැරිනයක් සේ ජලයේ ගමන් කරන්නටත් අවශ්‍ය විටකදී (ගොදුරක් ඩැහැගැනීමට) මතුවන්නටත් හැකි සතෙකි කිඹුලා. සිය මාංශ භක්ෂණ ජීවන රටාව කෙරෙහි ඌ හොඳින් හැඩගැසී ඇත. ඊට ලොකුම සහය ලැබෙන්නේ පෙරස්කෝපයක් සේ බඳු ඉහළට මතුවූ ඇස්වලිනි. මේ ඇස්වලින් ඌට දහවලේ දී මෙන් ම රැයේදී ද හොඳ පෙනීමක් ලැබේ. ප්‍රහාරයකදී උගේ ඇස ආරක්ෂක සොකට්ටුවක් ලෙස ක්‍රියා කරයි. සවිමත් හනු ද අගුළු සේ ක්‍රියාකරයි. ගොදුරට ගැලවී යන්නට බැරිවන සේ ඒවා තද වේ.

කිඹුලාට හොඳ ශ්‍රවණ සංවේදනයක් හා ගන්ධ සංවේදනයක් ඇත. මේවා මෙලෙස තියුණු වී ඇත්තේ ද උගේ ජීවන රටාවට අනුවර්තනයක් පරිද්දෙනි. මාංශපේශීමය වලිගය මීටර 1.8 ක් දිගු කළ හැක. උන්ට ඉන් පැයට කිලෝමීටර 32 ක වේගයෙන් ප්‍රහාර එල්ල කළ හැක. වෙනත් උරගයන්ට සේම කිඹුලාට ද තම සිරුරට ශක්තිය ලබාගැනීම සඳහා සූර්යාලෝකය භාවිත කළ හැක. එහෙයින් ඌට තම පැවැත්ම සඳහා අවශ්‍ය වන්නේ සුළු ආහාර ප්‍රමාණයකි. තාප සංවේදී කැමරා භාවිත කොට, කළ පරීක්ෂණ මගින් හෙළිව ඇත්තේ කිඹුලා ගේ පිට පැත්තේ සූර්ය රශ්මිය අවශෝෂණය කරගත හැකි සූර්ය පැනල බඳු ව්‍යූහ ඇති බව ය. ඉන්පසුව සූර්ය රශ්මිය මුළු රුධිර සංසරණය පුරා ව්‍යාප්තවීම ද සිදු වේ. මේ තාපය කිඹුලා ගේ කාර්යයන් රැසක් සඳහා අවශ්‍ය වේ. වැඩිපුරම එය අවැසි වන්නේ කෑම දිරවීමට ය. කිඹුලා ගේ දේහය ශීතලව පැවතියා නම් උගේ ආහාර උදරය තුළ ම කුණු වී විෂවන්නට ඉඩ තිබිණි. කිඹුලා ගැන මෙවැනි වැදගත් තොරතුරු රැසක් ඩිස්කවරි නාලිකාවේ අල්ටිමේට් ගයිඩ් තුළින් ඔබට දැකගත හැකි ය. කිඹුලා අයත් රෙප්ටිලියා වර්ගයට ය.

රෙප්ටිලියා වර්ගය (Reptilia) ට කටුස්සෝ, සර්පයෝ, කිඹුල්ලු, ඉදිබුවෝ සහ කැස්බෑවෝ අයත් වෙති.

# ඩිස්කවරි ඇස ගැසුණු තැන්



නිදහස් භෞමික ජීවිතයකට පළමුවෙන් ම හැඩ ගැසුනේ මේ සත්ත්ව කාණ්ඩය යි. වැදගත් කරුණු දෙකකින් උන් උභයජීවීන් ට වඩා දියුණු ය.

මේ නිසා උන්ට ජලයෙන් ම තොරව ජීවත් වීමට පුළුවන් වී ඇත. පළමු කරුණ නම්, ශරීර පෘෂ්ඨයෙන් ජලය නැති වී යාම බෙහෙවින් ම අඩු වන පරිදි සම්පූර්ණයෙන් ම වියළි හමක් උන්ට ඇති වීම යි. දෙවැන්න නම්, උන්ගේ බිත්තර ගොඩබිම දැමිය හැකි වන පරිදි කටුවකින් සහ ඇතැම් විශේෂ පටලවලින් ද යුක්ත වීම යි. එපමණක් නො ව ගොඩබිම ජීවිතයට සුදුසු වන සේ කායික ව්‍යූහයේත් කෘත්‍යවලත් වෙනත් දියුණු ලක්ෂණ දක්නට ඇත. අප හොඳින් දන්නා නොයෙකුත් කටුසු දර්ශ ඇත. කොරපොතු සහිත සමකුත් දිග වලිගයකුත් ඇති කටුස්සා ද නිතර ගෙබිත්තිවල දක්නට ලැබෙන හූනා ද මීට නිදසුන් වෙති. වෙනත් විශාල හූනන් කැලෑවලත් ගස්වලත් ජීවත් වනු දක්නට ලැබේ. ඉතා දීප්තිමත් වර්ණයෙන් යුත් නොයෙක් හිකනල්ලු කුණු ගොඩවල වෙසෙති. හිකනලුන් ගේ ගාත්‍ර ක්ෂීණ වී ශරීරය සියුමැලි වී ඇත. මේ අය ද කිඹුලා ගේ පරිනාමිත ඥතීන් ය.

සර්පයන් හැරුණු විට, විශාලතම ජීවමාන උරගයන් වන්නේ කිඹුල්ලු යි. දිග අඩි 15 ටත් අධික ප්‍රමාණයකට කිඹුල්ලු වැඩෙති. උන් ජීවත් වන්නේ ඔස්ට්‍රේලියාවත් ඇතුළු ව නව සහ පැරණි ලෝකවල නිවර්තන පෙදෙස්වල ය. කටුසු වැනි දේහයක් ඇති නමුදු ඝණ කොරොස් පොතුවලින් තදින් සන්නාහය වී තිබේ. පිටේ සහ බඩේ, මෙම කොරොස් පොතු ආවරණයට යටින් අස්ථි පිහිටා තිබීම නිසා එම කොටස් වඩාත් ශක්තිමත් වෙයි. කිඹුල්ලුන්ට ප්‍රබල ශක්තිමත් හනු ඇත. එම හනුවල කුහර තුළ පිහිටි කේතු හැඩැති ප්‍රබල දත් තිබේ. පූර්ව ගාත්‍ර අපර ගාත්‍රවලට වඩා කෙටි ය. වලිගය දිග ය, ශක්තිමත් ය. ඇසුත් නාස් පුඩුත් පමණක් දියෙන් පිටත සිටින සේ මේ සත්තු බොහෝ වේලා ජලයේ ගත කරති. මෙසේ උන් හොඳින් සැඟවෙන බැවින් ජලය බීමට පැමිණෙන සතුන් අල්ලා ගැනීමට උන්ට පුළුවන් වෙයි. මිනිස්සු ද කිඹුලන්ට ගොදුරු වෙති. මෙරටත් වෙනත් රටවලත් කිඹුලන්ට ගොදුරු වී මිනිස් ජීවිත නැති වුණු අවස්ථා එමට, ය. කිඹුල්ලු ගං ඉවුරුවලත් වගුරු බිම්වලත් ගුල් සාද ගෙන ඒවා තුළ ජීවත් වෙති. සාමාන්‍යයෙන් මේ ගුල්වල කට පිහිටා ඇත්තේ ජල මට්ටමෙන් පහළ ය. අවුරුදු හය කෝටියකටත් උඩදී නෂ්ට වී ගිය ආදි අතීතයේ විසූ විශාල ඩෛනොසෞර පෙළපතෙන් දැනට අවශේෂ ව ඇත්තේ කිඹුලන් පමණකි.

ජීවමාන උරගයන් ගේ අවසාන කාණ්ඩයට ඉදිබුවෝ ද කැසුබුවෝ ද අයත් වෙති. ශක්තිමත් අස්ථිමය පෙට්ටියක් තුළට වැද්ද ගත හැකි ඉතා කෙටි ශරීරයක් තිබීම මේ කාණ්ඩයේ විශේෂ ලක්ෂණය යි.

මුන්ගෙන් ඇතැමෙක් ගොඩබිම වෙසෙති. ඇතැමෙක් මිරිදියෙහි වෙසෙති. ආහාරයට ගන්නා කොළ කැස්බා වැනි තවත් සමහරෙක් මුහුදෙහි වෙසෙති. බිත්තර දැමීමට පමණක් ගොඩබිමට එන මුහුදු කැසුබ්බුවන් ගේ ගාත්‍ර, පිහිනීම සඳහා අවල්පත් බවට විකරණය වී තිබේ. මුහුදු කැසුබ්බුවන් බිත්තර දැමීමට වෙරළට එන්නේ එක්තරා කාල වේලාවක දීත් එක්තරා ස්ථානවල දීත් ය. වැල්ලෙහි ගුල් තුළ ඔවුන් බිත්තර සඟවන නමුත් මිනිස්සු ඒවා පහසුවෙන් සොයා එකතු කරගෙන ආහාර ද්‍රව්‍යයක් වශයෙන් විකුණති. මේ හේතුව නිසා ඇතැම් කැසුබු විශේෂ ලෝකයෙන් සදහට ම තුරන් වී යෑමේ තර්ජනයට ලක් ව ඇත. වැඩුණු කැසුබ්බුවන් ගේ මස් ද ආහාරයක් වශයෙන් අගය කොට සලකනු ලැබේ. උන් අල්ලාගනු ලබන්නේ විශේෂ දැල්වලිනි. කැසුබ්බුවෝ අඩි 7 ක් පමණ පළලට වැඩෙති. ඉදිබුවන් සාමාන්‍යයෙන් ඊට වඩා කුඩා ය. එහෙත් ඉන්දියන් සාගරයේ සේෂෙල්ස් ද පැසිපික් සාගරයේ ගලපගාස් ද වැනි දූපත්වල දක්නට ලැබෙන ඉදිබුවෝ ඉතා විශාල වත් බරටත් වැඩෙයි.

## ෆුජියාමා - රෝල කෝස්ටර

රෝල කෝස්ටර ගැන වැදගත් තොරතුරු ඔබට ත්‍රිල් රයිඩර්ස් වැඩසටහනෙන් දැනගත හැකි ය.

ජපානයේ ෆුජි කන්දේ පිහිටා ඇති "ෆුජිකියු හයිලන්ඩ්" උද්‍යානයේ පිහිටා ඇති ෆුජියාමා රෝල කෝස්ටරය ලොව වේගවත් ම වානේ රෝල කෝස්ටරය යි. එනිසාම එය හැඳින්වෙන්නේ "කෝස්ටර රාජා" යන විරුදාවලියෙනි. මෙය ගොඩනගන ලද්දේ 1996 දී ය.

මේ රෝල කෝස්ටරය ගමන් ගන්නා වේගය පැයට කි. මී. 138.4 කි. ලොව දෙවැනි වේගවත් රෝල කෝස්ටරයේ වේගය පැයට කි. මී. 128.8 කි. එය පෙන්සිල්වේනියාවේ ස්ටීල් ෆැන්ටම් රෝල කෝස්ටරය යි. ෆුජියාමා වේගවත් ම රෝල කෝස්ටරය පමණක් නොවේ. එය උසින් වැඩිම රෝල කෝස්ටරය ද වේ. එහි උස මීටර 79 කි.

## ෂටල් කෝස්ටර

ෂටල් කෝස්ටරයක් යනු ඉදිරියට ගමන් කොට එක් තැනක දී නැවතී යළි පිටුපසට රෝල්වන ආකාරයේ එකකි.

ඇමරිකාවේ සික්ස් ෆැලාග්ස් මැජික් මවුන්ටන් හි "සුපර්මෑන් ද එස්කේප් මෙවැනි ෂටල් කෝස්ටර ක්‍රීඩා පවතින තැනකි. ඕස්ට්‍රේලියාවේ ඩ්‍රීම්වර්ල්ඩ් හි "ටවර් ඔෆ් ටෙරෙ" ද එවැනි තව තැනකි. මේ අතරෙන් උසම "සුපර්මෑන් එස්කේප්" ය. එහි උස මීටර් 127 කි.

* ලොව විශාලතම රෝල කෝස්ටරය බ්‍රිතාන්‍යයේ "ද අල්ටිමේට්" ය. එහි සම්පූර්ණ විශාලත්වය මීටර් 2270 කි.

* වැඩිම දඟර හා පුඩු ගණනක් ඇති රෝල කෝස්ටරය ස්පාඤ්ඤයේ "ඩ්‍රැගන් ඛාන්" ය මෙමගින් මීටර 1270 ක් දිග වානේ පථයක ගමන් ගන්නා අයකු අට වතාවත් යට අතට හරවයි.

* ලොව පැරණිම රෝල කෝස්ටරය (දැනටත් භාවිත වන) ඇත්තේ ඩෙන්මාර්කයේ කොපන්හේගන්වල ය. රට්වොබා එම් කේ 2 නම් එය මහජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක වූයේ 1914 දී ය.





## බෲස්ලී

ජැකී චැන් හා ෂෙට්ලිස් අද හොලිවුඩ් පුරයේ වීරයන් බවට පත්ව ඇත්තේ එක් මිනිසකුට පිංසිදුවන්නට ය. ඒ තැනැත්තා නොසිටියා නම් අද ඔවුන් මෙතරම් ජනප්‍රියව සිටින්නේ නැත. ඔහු අනෙකකු නොව බෲස්ලී ය. 1973 අගෝස්තුවලදී බෲස්ලී "එන්ටර් ද ඩ්‍රැගන්" චිත්‍රපටියේ රඟපෑ අතර එයින් පසු ඔහුට හිමිවූවේ සුළුපටු ප්‍රසාදයක් නොවේ. එසේම සටන්කලා පුරෝගාමියකු ලෙස ද ඔහු නමක් දිනාගත්තේ ය. එන්ටර් ද ඩ්‍රැගන් චිත්‍රපටිය ලොව පුරා චිත්‍රපටශාලාවල විශාල ප්‍රේක්ෂක ප්‍රතිචාර මත තිරගත වූ අතර ඉන් ලැබූ ආදායම අති විශාල විය. ඇමරිකාවේ පළමු දින 7 තුළදී ලද ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 3 කි. බෲස්ලී ගැන විස්තර ඩිස්කවරි නාලිකාවේ ද ග්‍රේටස්ට් බෲස්ලී තුළින් ඔබට දැනගත හැකි ය.

## එල්නිනෝ
## ELNINO

එල්නිනෝ සංසිද්ධිය යනු කුමක් ද? ඉතාමත් ම සරල ලෙස කිවහොත් මෙය නැගෙනහිර පැසි-පික් සාගරයේ දකුණු ඇමරිකානු පේරු වෙරළට ඔබ්බෙන් වූ නිර-වර්තන සාගර ප්‍රදේශයේ උෂ්ණත්-වය ඉහළ යාම ය. මෙසේ ඉහළ යන්නේ සෙන්ටිග්‍රේඩ් අංශක 1 සිට 4 දක්වා වූ ප්‍රමාණයකිනි. එල්-නිනෝ ක්‍රියාවලියේ උච්චම අවස්-ථාව දෙසැම්බර් මස දී ඇතිවන අතර ඇතැම් විට එම තත්ත්වය ඊළග මාස ගණනාවක් පුරා බලපැවැත්විය හැක. නත්තල් උත්සව සමයේ දී මෙය ඇතිවීම නිසා පේරු ධීවරයන් විසින් ක්‍රිස්තු දරුවා යන අරුත දෙන එල්නිනෝ යන නම මේ සංසිද්ධියට යොදා ඇත. මෙහි විරුද්ධ අරුත දෙන වචනය ලා නිනා ය. ලා නිනාවකදී වන්නේ පේරු වෙරළට ඔබ්බෙන් පිහිටි නිවර්තන පැසිපික් සාගර පෙදෙසේ මතුපිට උෂ්ණත්වය සෙන්ටිග්‍රේඩ් අංශක කීපයකින් පහළ බැසීම ය. එල්නිනෝ අවස්ථා-වක් පවතින විට එහි ප්‍රබලතාව මැනීමට විශේෂ දර්ශකයක් යොදා ගනී. එය දක්ෂිණ දෝලන දර්ශකය ලෙස නම් කර ඇත.

මෙය ඕස්ට්‍රේලියාවේ ඩාවින් හා නැගෙනහිර පැසිපික් සාගරයේ ටහිටි දූපත යන ස්ථාන දෙකේ පවතින වායුගෝලීය පීඩනවල වෙනස ලබාගෙන එමගින් ගණනය කරගනු ලබන දර්ශකයකි. මේ දර්ශකයේ අගය සෘණ වනවිට එල්නිනෝ අවස්ථාව ලෙස ද ධන-වන විට ලානිනා අවස්ථාවක් ලෙස ද නම් කෙරේ.

ඩිස්කවරි නාලිකාවේ ඇනටොමි ඔෆ් ඩිසැස්ටර් තුළින් ඔබට දැකගත හැක.

## එවරස්ට් (හිමාලය) ලොව උසම කන්ද (මීටර 8850)

එවරස්ට් කන්ද බලන්නට ලස්-සන තැනකි. එහෙත් නගින්නට නම් බියකරු තැනකි. එහි නගින්නට ගිය අයගෙන් 160 කට වැඩි දෙනකු ගේ ජීවිත කන්ද විසින් බිලිගෙන ඇත. තත්ත්වය එසේ වුවත් අදත් හැම වසරකම පුද්-ගලයෝ සියයකට අධික පිරිසක් හිමාලය නගිති.

මරණය පෙනි පෙනීත් මේ අය හිමාලය නගින්නේ ඇයි? ඔවුන් එවැනි දෙයකට පෙළඹවන්නේ කුමක් මගින් ද? එවරස්ට් මුදුනේ රැයක් ගතකිරීම (ඔක්සිජන් රහි-තව) ලෙහෙසි පහසු දෙයක් නොවේ. සමහරවිට එය මරණ-යෙන් කෙළවර වන දෙයකි. පළමු-වෙන් ම එවරස්ට් තරණය කළේ එඩ්මන්ඩ් හිලරි හා ටෙන්සි ය.



## තල්මසා

ඒ සතා යෝධයෙකි. එහෙත් අද ඒ යෝධයා ද මිනිසා නිසා වඳවීමේ තර්ජනයට මුහුණ දී තිබේ. මේ අප කියන්නේ අනෙකකු ගැන නොව මුහුදු ක්ෂීරපායියකු වන තල්මසා ගැන ය.

ඇතැම් ක්ෂීරපායීන් ජීවත් වීම සඳහා ජලයටම ගොස් ඇත. දිය බල්ලාත් බිවරාත් වැඩි කාලයක් ගත කරන්නේ මිරිදියෙහි ය. උන්ට ජලයෙන් පිට වී ගොඩබිම සැරි සරන්නට ද පුළුවන. සීල්ලුන් උන්ට නැකම් ඇති සත්තුන් මුහුදෙහි වෙසෙති. උන් ගොඩබිමට එන්නේ අභිජනනය සඳහා පමණි. උන්ගේ ගාත්‍රා පිහිනීම සඳහා හැඩගැසී ඇති බැවින් ගොඩබිම පහසුවෙන් ඇවිදීමට නො හැකි ය. ජලයෙහි ම ජීවත් වන තල්මසුන්, ඩොල්පිනුන් සහ පෝපසුන් ද කිසි ම අවස්ථාවක ගොඩබිමට පැමිණෙන්නේ නැත. උන් ගේ බාහිර පෙනුම මත්ස්‍යයකු ගේ වැනි ය: අඩි 1000 කටත් වැඩියෙන් දික් වී වැඩෙන නිල් තල්මසා මිහි පිට මෙතෙක් ජීවත් වූ විශාල ම සතා වෙයි. ඩොල්පිනුන් ද උන්ට නැකම් ඇති වෙනත් සතුන් ද ඉතා බුද්ධිමත් බව මෑතක දී අවබෝධ කර ගෙන ඇත. ඒ අතින් උන් දෙවැනි වන්නේ මිනිසාට පමණි. හොඳින් විකසනය වූ රේඩාර් පද්ධතියක් උන්ට ඇත. ඔවුනොවුන් අතර අදහස් හුවමාරු කරගැනීමටත් උන්ට පුළුවන. සම්පූර්ණයෙන් ම ජලවාසී තවත් ක්ෂීරපායී කාණ්ඩයෙකි, මුහුදු ඌරෝ සහ මැනටියෝ, මෙරට වෙරෙළෙහි, විශේෂයෙන් මන්නාරම් බොක්කේ නොගැඹුරු දියෙහි, මුහුදු ඌරන් දක්නට ලැබේ. උන්ට ද තල්මසුන්ට මෙන් පිහිනීම සඳහා අවල්පත් බවට පත් වුණු පූර්ව ගාත්‍රා ද වරල් සහිත වලිගයක් ද ඇත. තල්මසුන් සහ ඩොල්පින්නු ශීඝ්‍ර පිහිනුම්කරුවන් වන නමුදු, මුහුදු ඌරෝ බර දේහයකින් යුත් සෙමින් එහා මෙහා යන සත්තු වෙති. උන් සම්පූර්ණයෙන් ම ශාක භක්ෂක ය. මුහුදු පත්ලෙහි විශාල වශයෙන් පැතිරී ඝනට වැඩී තිබෙන මුහුදු පැලෑටි ආහාර කොට ගනිති. මස ලබා ගැනීම සඳහා මුහුදු ඌරන් අල්ලා මරණ බැවින් උන් සඳහට ම ලෝකයෙන් තුරන් වී යෑමට ආසන්න ය. තල්මසා හා වෙනත් මුහුදු ක්ෂීරපායීන් ගැන වැදගත් තොරතුරු රැසක් ඔබට ලොස්ට්වේල්ස් වැඩසටහනෙන් දැනගත හැක.

## වැම්පයර් පියාසැරිය

නියම ලෙස පියාසර කරන එකම ක්ෂීරපායී සතා වවුලා ය. වවුලන් ගේ පියාපත් පක්ෂීන් ගේ පියාපත්වලට වඩා බෙහෙවින් වෙනස් ය. ඒවා සෑදී ඇත්තේ සම් පටලයකිනි. තවද උන්ගේ අපර ගාත්‍ර දුබල ය. එබැවින් ගොඩබිමෙහි සාමාන්‍ය ලෙස ඇවිදීමට නොහැකි යි. කළුවර තැන්වල එල්ලී සිටීමට උන්ගේ පාද භාවිත වේ. ආහාර සෙවීම පිණිස උන් රාත්‍රී කාලයේ දී එතැන්වලින් එළියට එති. ඇතැම් වවුලෝ පලතුරු බුදින්නෝ වෙති. ඇඳිරි වැටෙන යාමයේ දී මෙම වවුලන් රැන් වශයෙන් ගොදුරු සොයා පියාඹා යනු දක්නට ලැබේ. වඩා කුඩා වවුලෝ කෘමිභක්ෂකයෝ වෙති. බාධක මග හැරීමට උපකාර වන බෙහෙවින් විකසනය වූ රේඩාර් පද්ධතියක් වවුලන්ට ඇත.

භූගත ජීවිතයක් ගත කරන ක්ෂීරපායීන් වර්ග කිහිපයක් ද සිටිති. මෙවැනි පැවැත්මක් සඳහා වැලි මීයා ගේ ශරීරය හොඳින් විකරණය වී තිබේ. පොළොව හැරීම සඳහා ශක්තිමත් නඛර සහිත හැඩි දැඩි පූර්ව ගාත්‍ර යුගලක් ඌට ඇත. වවුලා පිළිබඳ වැදගත් තොරතුරු රැසක් ඩිස්කවරි නාලිකාවේ වැම්පයර් ඇට් ප්ලයිට් මගින් දැකගත හැක. ❑